# ද්විපද ආකෘතිය භාවිතයෙන් සම්භාවිතා ගැටළු විසඳීම.

- ප්‍රතිඵල දෙකකින් පමණක් සමන්විත එක් සසම්භාවී පරීක්ෂණ අවස්ථාවක් **බර්නොලි නැහැසුමක්** ලෙස හැඳින්වේ.
- ප්‍රතිඵල දෙකකින් පමණක් සමන්විත සසම්භාවී පරීක්ෂණයක් එක් වරකට වඩා සිදු කරන්නේ නම් එවැනි එක් පරීක්ෂණ අවස්ථාවක් ද්විපද නැහැසුමක් නම් වෙයි.
- ද්විපද පරීක්ෂණයකට අදාළව අර්ථ දක්වනු ලබන සසම්භාවී විචලායකට සම්භාවිතා ව්‍යාප්තියක් පැවතීම සඳහා පහත සඳහන් කොන්දේසි හතර තෘප්ත කළ යුතුය.

  1.පරීක්ෂණය නිශ්චිත නැහැසුම් ගණනකින් සමන්විත විය යුතුය.

  2.එක් එක් නැහැසුම සාර්ථකය (S) හා අසාර්ථකය (F) ලෙස ප්‍රතිඵල දෙකකින් පමණක් සමන්විත විය යුතුය.

  3.එක් එක් නැහැසුමේදී සාර්ථකය ලැබීමේ සම්භාවිතාව සමාන විය යුතුය.

  4.එක් එක් නැහැසුම අන් සියලු නැහැසුම්වලින් ස්වායත්ත විය යුතුය.

## <u>ක්‍රියාකාරකම</u>

වරණ පහකින් යුත් බහුවරණ ප්‍රශ්න පත්‍රයක ප්‍රශ්න 5කට ශිෂ්‍යයෙක් අහඹු ලෙස පිළිතුරු සැපයුවේ නම්,

1.එක් පිළිතුරක්වත් නිවැරදි නොවීමේ

2.එක් පිළිතුරක් පමණක් නිවැරදි වීමේ

3.පිළිතුරු දෙකක් පමණක් නිවැරදි වීමේ

4.වැඩි වශයෙන් පිළිතුරු දෙකක් නිවැරදි වීමේ

5. අඩු වශයෙන් පිළිතුරු දෙකක් වත් නිවැරදි වීමේ සම්භාවිතාව සොයන්න.